පුනරුත්ථාපන කාර්යාංශය
BUREAU OF REHABILITATION

more articles

# පුනරුද පුවත්
# REHAB NEWS
# புனர்வாழ்வு செய்திகள்




Merry Christmas

2024
සිව්වන කලාපය

# පුනරුද පුවත් සඳහා ජීවය සපයන්නෝ

**උපදේශකත්වය**

මේජර් ජෙනරල් ඩී ඩී යූ කේ හෙට්ටිආරච්චි (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී එම්ඒ
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්

**අධීක්ෂණය**

ලුතිතන් කර්නල් ඒඑම්ඒ දේශප්‍රිය
සහකාර කොමසාරිස් පුනරුත්ථාපන

**සංස්කරණ මණ්ඩලය**

කේඒකේඑස් තිලකසිරි මහතා
(කාර්යාංශ මූලස්ථාන ප්‍රධාන ලිපිකරු)
කේඑස් පෝල් මහතා

**පරිගණක නිර්මාණය සහ පිටු සැකසීම**

එච්එම්පීඑස් කරුණාතිලක

**ලිපිනය**

සංස්කාරක,
පුනරුද පුවත්,
පුනරුත්ථාපන කාර්යාංශය,
462/2 කඩුවෙල පාර, ගනහේන,
බත්තරමුල්ල.

**විද්‍යුත් තැපෑල**

bcgr.media@gmail.com

**දුරකථන අංක**

0112-883891
0112-577457

**ෆැක්ස්**

011 288 37 37
011 288 38 99

# SLS ISO 9001(2015)
## තත්ත්ව සහතිකයෙන් පිදුම් ලද පළමු රාජ්‍ය ආයතනය බවට පුනරුත්ථාපන කාර්යාංශය පත්වෙයි.

පුනරුත්ථාපන කාර්යාංශයේ පුනරුත්ථාපන වැඩසටහන වෘත්තීය පුහුණුව සහ පරිපාලනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බවට තහවුරු කර SLS ISO 9001 – 2015 සහතිකය පිරිනමන ලදී.

මෙවැනි ක්ෂේත්‍රයක නියැලෙන රාජ්‍ය සංවිධානයක් SLS ISO 9001 – 2015 සහතිකයෙන් පිදුම් ලැබූ ඉතිහාසයේ පළමු අවස්ථාව මෙයයි.













මේ සබැඳි පුවත් නැරඹීම සඳහා ඉහත QR කේතය ස්කෑන් කරන්න.

SLAB ACCREDITED ISO/IEC: 17021 EMS-001-01
SLSI SYSTEM ISO 9001 CERTIFIED
RvA MGMT. SYS. C 155



# "නොසිතූ නිවහන"

## කාව්‍ය සංග්‍රහය දොරට වැඩීම

පුනරුත්ථාපන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක කන්දකාඩු - නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ පුනරුත්ථාපන ලබන පුනරුත්ථාපනලාභියකු වන **රමින්ද ෆොන්සේකා මහතා විසින් කුළුදුලේ රචිත "නොසිතූ නිවහන" කාව්‍ය සංග්‍රහය** දොරට වැඩීමේ උත්සවය 2024.11.05 දින පුනරුත්ථාපන කාර්යාංශ මූලස්ථාන ශ්‍රවනාගාරයේ දී උත්කර්ශවත් අන්දමින් පැවැත්වින.

සිය පුනරුත්ථාපන කාලය තුළ දී ඔහු විසින් නිර්මිත කාව්‍යයන් ඇතුළත් මෙම කාව්‍ය සංග්‍රහය දොරට වැඩීම අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ආර්පීවීස් සමන් කුමාරි මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ ප්‍රධාන මූල්‍ය නිළධාරි ආර්එම්ඩීකේ රාමනායක මහත්මිය, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී, සංස්කාරක,හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනයේ තුෂාල් විතානගේ මහතා,





මාතලේ ශ්‍රී සුමංගල විද්‍යාලයේ විදුහල්පතිනි සුභාෂිනී ඒකනායක මහත්මිය, රමින්ද ෆොන්සේකාගේ මෑණියන් වන රමණී ෆොන්සේකා මහත්මිය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජෙනරල් දර්ශන හෙට්ටිආරච්චි මහතා ප්‍රමුඛ සියලු නිළධාරින් සහ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සිදු විය.


: bcgr.media@gmail.com : www.bor.gov.lk

# ව්‍යාපාරයේ නවීන තාක්ෂණය භාවිතය



නවීන තාක්ෂණය විවිධ කර්මාන්ත හරහා ව්‍යාපාරික මෙහෙයුම්වල අනිවාර්ය අංගයක් වී ඇත. එය ව්‍යාපාර සන්නිවේදනය, සහයෝගීතාව, ඔවුන්ගේ නිෂ්පාදන සහ සේවා අලෙවි කිරීම, ක්‍රියාවලි විධිමත් කිරීම සහ දැනුවත් තීරණ ගැනීමේ ආකාරය විප්ලවීය වෙනසක් සිදු කර ඇත. නවීන තාක්ෂණය ව්‍යාපාරයේ බහුලව භාවිතා වන ප්‍රධාන අංශ කිහිපයක් මෙන්න

**සන්නිවේදනය සහ සහයෝගීතාව:** ව්‍යාපාරයන්හි අභ්‍යන්තරව සහ බාහිරව සන්නිවේදනය කරන ආකාරය තාක්ෂණය විසින් පරිවර්තනය කර ඇත. විද්‍යුත් තැපෑල, ක්ෂණික පණිවිඩ යැවීම, වීඩියෝ සම්මන්ත්‍රණ සහ සහයෝගිතා මෙවලම් මගින් කණ්ඩායම්වලට භූගෝලීය සීමාවන් නොසලකා දුරස්ථව සම්බන්ධ වීමට සහ එකට වැඩ කිරීමට හැකියාව ලැබේ. මෙම තාක්ෂණයන් ඵලදායිතාව ඉහළ නංවයි, තත්‍ය කාලීන තීරණ ගැනීමට පහසුකම් සපයයි, සහ නවෝත්පාදනයන් පෝෂණය කරයි.



**ස්වයංක්‍රීයකරණය සහ කාර්යක්ෂමතාව:** ව්‍යාපාර පුනරාවර්තන කාර්යයන් ස්වයංක්‍රීය කිරීමට සහ ක්‍රියාවලි විධිමත් කිරීමට තාක්ෂණය උපයෝගී කර ගනිමින් කාර්යක්ෂමතාව වැඩි කිරීමට සහ පිරිවැය ඉතිරි කිරීමට හේතු වේ. රොබෝ ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (RPA), කෘතිම බුද්ධිය (Artificial Intelligence) සහ යන්ත්‍ර ඉගෙනීම (Machine Learning) දත්ත ඇතුළත් කිරීම, පාරිභෝගික සහාය, ඉන්වෙන්ටරි කළමනාකරණය සහ තත්ත්ව පාලනය වැනි කාර්යයන් සඳහා යොදනු ලැබේ.



**දත්ත කළමනාකරණය සහ විශ්ලේෂණ:** ඩිජිටල් යුගය විශාල දත්ත ප්‍රමාණයක් ජනනය කරන අතර තාක්ෂණය මඟින් ව්‍යාපාරවලට ක්‍රියාකාරී තීක්ෂණ බුද්ධිය සඳහා මෙම දත්ත රැස් කිරීමට, ගබඩා කිරීමට සහ විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබේ. උසස් විශ්ලේෂණ මෙවලම් සහ ව්‍යාපාරික බුද්ධි වේදිකා මඟින් පාරිභෝගික හැසිරීම්, වෙළඳපල ප්‍රවණතා සහ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට ආයතනවලට උපකාර කරයි, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමට ඔවුන්ව බලගන්වයි.

**ඊ-වාණිජ්‍යය සහ සබැඳි පැවැත්ම:** තාක්ෂණය ව්‍යාපාර නිෂ්පාදන සහ සේවා අලෙවි කරන ආකාරය විප්ලවීය වෙනසක් සිදු කර ඇත. ඊ-වාණිජ්‍යය වේදිකා මඟින් සමාගම්වලට සබැඳි වෙළඳසැල් පිහිටුවීමට, ගෝලීය පාරිභෝගික පදනමක් වෙත ළඟා වීමට සහ පුද්ගලික සාප්පු සවාරි අත්දැකීම් ලබා දීමට හැකියාව ලැබේ. මීට අමතරව, සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තිකරණය Search Engine Optimization සමාජ මාධ්‍ය අලෙවිකරණය සහ අන්තර්ගත අලෙවිකරණය ඇතුළු ඩිජිටල් අලෙවිකරණ ශිල්පීය ක්‍රම, වෙළඳනාම පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීමට සහ අන්තර්ජාලය හරහා ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීමට ව්‍යාපාරවලට උදවු කරයි.


ප්‍රභාත් ගුණරත්න මහතා
තොරතුරු තාක්ෂණ සහකාර
පුනරුත්ථාපන කාර්යාංශය

# CCTV සුරක්ෂා කැමරා පද්ධති වල වාසි



CCTV සුරක්ෂා කැමරා පද්ධති ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ ආරක්ෂාව සඳහා බොහෝ ප්‍රතිලාභ ලබා දෙයි:




අපරාධ වැළැක්වීම:
දෘශ්‍යමය පෙනුම: CCTV කැමරා දැකීමෙන් පමණක් අපරාධකරුවන්ට බාධා ඇති විය හැකි අතර සිදුවීම් සිදුවීමේ ඉඩකඩ අඩු වේ.

මනෝවිද්‍යාත්මක බලපෑම: ක්‍රියාවන් නිරීක්ෂණය කරනු ලබන බව දැන ගැනීම මගින් අසභ්‍ය හැසිරීම් වළක්වා ගත හැකිය.

අපරාධ විමර්ශනය:
සාක්ෂි රැස් කිරීම CCTV දර්ශන සැකකරුවන් හඳුනා ගැනීමට, සිදුවීම් නැවත ගොඩනැගීමට සහ නීතිමය ක්‍රියාමාර්ගවලට උපකාරී වන වැදගත් සාක්ෂි සපයයි.

රටා හඳුනා ගැනීම: දර්ශන විශ්ලේෂණය කිරීමෙන් අපරාධ ක්‍රියාකාරකම්වල ප්‍රවණතා සහ රටා හඳුනා ගත හැකි අතර ඉලක්කගත වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කළ හැකිය.

ජනතා සුරක්ෂාව:
පිරිස් අධීක්ෂණය: CCTV මහජන රැස්වීම් අධීක්ෂණය කිරීමට උපකාරී වන අතර තර්ජන හෝ කලබල හඳුනාගත හැකිය.

හදිසි ප්‍රතිචාරය: හදිසි අවස්ථාවල දර්ශන ගලවා ගැනීමේ උත්සාහයන් සම්බන්ධීකරණය කිරීමට සහ ගොදුරු වූවන් හඳුනා ගැනීමට උපකාරී වේ.

ව්‍යාපාරික මෙහෙයුම්:
සේවක අධීක්ෂණය: CCTV සේවක කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට සහ වැඩබිම තුළ ඇති ආරක්ෂක අවදානම් හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.
පාඩු වැළැක්වීම: සොරකම් වළක්වා ගැනීමට සහ පාඩු සඳහා වගකිවයුතු පුද්ගලයින් හඳුනා ගැනීමට උපකාරී වේ.



CCTV බොහෝ වාසි ලබා දෙන අතර එය වගකීමෙන් හා සදාචාරාත්මකව භාවිතා කළ යුතු බව සැලකිල්ලට ගත යුතුය. රහස්‍යතා අයිතිවාසිකම් සහ දත්ත ආරක්ෂණය සඳහා සුදුසු සැලකිල්ලක් දැක්විය යුතුය.

නිපුන් පලාපත්වල මහතා
තොරතුරු තාක්ෂණ සහකාර
පුනරුත්ථාපන කාර්යාංශය

# දීපාවලී දින සැමරුම් වැඩසටහන්

## නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු





## නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර





## සාරංගා මධ්‍යස්ථානය වව්නියාව





මේ පිළිබඳ වැඩිදුර තොරතුරු
නැරඹීම සඳහා
ඔබත් අද ම පුනරුත්ථාපන කාර්යාංශ
Facebook පිටුවට පිවිසෙන්න.

BUREAU OF
REHABILITATION

# පුනරුත්ථාපනලාභීන් සමාජගත කිරීම සහ

## වෘත්තීය පුහුණු පාඨමාලාවන්ගේ සහතික පත්‍ර ප්‍රදානය කිරීම

## නවෝදාව - තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර

සේනපුර - නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයෙහි පුනරුත්ථාපනයවූ පුනරුත්ථාපනලාභීන් 12 දෙනෙකු සමාජගත කිරීම සහ මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක විවිධ වෘත්තීය පුහුණු පාඨමාලාවන් හදාරන ලද පුනරුත්ථාපනලාභීන් 44 දෙනෙකු සඳහා සහතික පත් ප්‍රදානය කිරීමේ උත්සවයක් 2024.11.18 දින පවත්වන ලදී.







මෙම සමාජගත කිරීමේ උත්සවය පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජෙනරල් දර්ශන හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රධානත්වයෙන් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වසන්ත ගම්ලත් මහතා, නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානයෙහි පුනරුත්ථාපන අධිකාරි කර්නල් ගාමිණී ද සිල්වා, නවෝදාව - තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයෙහි පුනරුත්ථාපන අධිකාරි කර්නල් බීඩබ්ලිව්ජීඑස්බී අබේතිලක ඇතුළු නිළධාරින් සහ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සිදු විය.







## සමාජගත වූ පුනරුත්ථාපනලාභියකු හට වඩු කාර්මික ස්වයං රැකියා කට්ටල ප්‍රදානය කිරීම



සේනපුර නවෝදාව - තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයේ සාර්ථකව වඩු කාර්මික පාඨමාලාව හදාරා පුනරුත්ථාපනය අවසානයේ සමාජගත වූ එන්.නිපුන ධනංජය මහතා හට සිය ජීවනෝපාය සාර්ථක කරගැනීම සඳහා වඩු කාර්මික ස්වයං රැකියා කට්ටලයක් ප්‍රදානය කිරීම අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සංවර්ධන ආර්පීජීස් සමන් කුමාරි මහත්මිය සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් දර්ශන හෙට්ටිආරච්චි මහතා විසින් 2024.11.05 දින පුනරුත්ථාපන කාර්යංශ මූලස්ථාන ශ්‍රවනාගාරයේ දී සිදු කරන ලදී.


: bcgr.media@gmail.com : www.bor.gov.lk

# ජීවිතය සහ විනෝදාස්වාදය



විනෝදාස්වාදයක් සෑමවිටම ජීවිතයට අත්‍යවශ්‍යය අංගයකි. එය කාර්ය බහුලත්වය අධික හෝ දරාගත නොහැකි වගකීම් මත අඳුරු වූ ජීවිතයට ජීවන හුස්ම ලබා දෙන්නකි. එමගින් ඔබේ මනස ප්‍රබෝධමත් කර ඔබේ මානසික සෞඛ්‍යය මෙන්ම චිත්තවේගීය යහපැවැත්ම ආරක්ෂා කරයි. එය ඔබේ ජීවිතයට සතුට ගෙන එනවා මෙන්ම එය බොහෝ විට ඔබව ඔබේ මිතුරන්ට සහ පවුලේ සාමාජිකයන් හා සමීප කරවයි. එබැවින් ජීවිතයට විනෝදාස්වාදයක් බොහෝ ආකාරයෙන් ප්‍රයෝජනවත් විය හැක.

## විනෝදාස්වාදය ඔබේ ආතතිය දුරු කරයි.

විනෝදාස්වාදයකට ඔබේ ජීවිතයේ ආතතිය ඇති කරන සාධකවලින් ඔබේ අවධානය වෙනතකට යොමු කළ හැකිය. ඔබ විනෝදාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙන විට ඔබේ ශරීරය එන්ඩොර්ෆින් හෝමෝන නිකුත් කරයි. මෙම රසායනිකය ආතතිය සහ වේදනාව සමනය කරන බව ප්‍රසිද්ධ කරුණකි. එම නිසා, විනෝදාස්වාදයකට හුරු වීම මගින් ඔබේ ජීවිතයට යම් සතුටක් එක් කර ගත හැකිය. ඔබට විනෝදාංශයක් තිබේ නම්, එය ඔබට විනෝදාස්වාදය ලබා දෙන අතරම එමගින් ඔබේ ජීවිතයේ නිර්මාණාත්මක අංශය උත්තේජනය කිරීමට ඔබට හැකියාව ලැබේ.

## විනෝදාස්වාදය ඔබේ සමාජ සංස්කෘතිය පෝෂණය කරයි

සංස්කෘතිය සහ විනෝදාස්වාදය අතර සමීප සම්බන්ධයක් පවතී. බොහෝ විනෝදාත්මක ක්‍රියාකාරකම් තුළ ඒවාට අනන්‍ය උප සංස්කෘතීන් ඇත. සංස්කෘතිය යනු පුද්ගල කණ්ඩායමක ජීවන රටාව හෝ ඔවුන් තම ජීවිතය ගත කරන ආකාරය හෝ සමාජීයව ක්‍රියා කරන ආකාරය විස්තර කිරීමට භාවිතා කරන වචනයක් ලෙස හැඳින්විය හැකිය. නිදසුනක් වශයෙන්, ඔබට සති අන්තයේ ඔබේ මිතුරන් හමුවීමට සහ චිත්‍රපට නැරඹීමට හෝ ක්‍රීඩා කිරීමට හැකිය. මෙවැනි ක්‍රියාකාරකම් තුළින් ඔබ අවට මිතුරු හවුලක් ගොඩනැගෙන අතරම ඉබේම ඒ වටා සමාජ සංස්කෘතියක් ද ගොඩ නැගේ.

## ඔබේ ආත්මාභිමානය වර්ධනය කරයි

ඔබ ඵලදායී වූ විට ඔබට වඩා විශාල ඉලක්කයන් ජය ගැනීමටත් එතුළින් ඔබේ ආත්මාභිමානයේ වර්ධනය වීමත් දැක ගත හැකිය. එමෙන්ම, ඔබ පවුලේ සමාජිකයින්, මිතුරුන් හා සමග විනෝද වීමට කාලය යොදන අයෙක් නම් මෙම සමීප හැඟීම ඔබේ විශ්වාසය සහ ආත්ම අභිමානය වැඩි දියුණු කරයි. ජීවිතයේ ඉදිරියට යාමට, ඔබව දිරිමත් කිරීමට ඔබට හොඳ මිතුරන් සහ පවුලේ සාමාජිකයන්ගේ සහය සාධකයක් වේ.

## ඒ අනුව විනෝදාස්වාදය ඔබේ ජීවිතය සතුටින් පුරවයි

ඉහතින් සඳහන් වුනේ විනෝදාස්වාදයක් ඇති කර ගැනීමේ ප්‍රතිලාභයන් කිහිපයකි. එමගින් ආතතිය අවම කරවන අතර, සමාජය තුළ අපූරු සංස්කෘතියක් බිහි කරවයි. නිර්මාණශීලිත්වය වර්ධනය කරමින් රැකියා මූලාශ්‍රයක් බවට ද විනෝදාස්වාදය පත් වන අතර, රටක ආර්ථිකය ද ඉහළ නංවයි. මිත්‍රත්වය වර්ධනය කරමින් සන්නිවේද කුසලතා සංවර්ධනය කරමින් ආත්මාභිමානය ඉහළ නංවයි. අධ්‍යාපනික කටයුතු වඩා ඵලදායී බවට පත් කරවනු ලබයි.

**සමස්ථයක් වශයෙන් ගත් කල විනෝදාස්වාදය ජීවිතයේ අනිවාර්ය සහ වැදගත් අංගයක් වන අතර, මනුෂ්‍යයෙක් වශයෙන් ජීවිතය අර්ථවත් කරගැනීමට මෙමගින් මහගු පිටුවහලක් ලැබෙන බවත් එමගින් ජීවන තත්ත්වය වඩා ඉහළ නැංවීමටත් හැකි බව පෙනී යන කරුණකි. ජීවිතය ජය ගන්න අත් වැලක් කරගන්න, ඔබත් ඔබේ ජීවිතයට විනෝදාස්වාදයක් එක් කර ගන්න.**

**කේඑස් පෝල් මහතා**
කළමණාකරණ සහකාර
මාධ්‍ය අංශය

# පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

කොළඹ 2 සමාජගත පුනරුත්ථාපනලාභීන්ගේ සුභසාධන කටයුතු සඳහා ක්‍රියාත්මක වන පුනරුත්ථාපනය වූවන්ගේ ආර්ථික සමාජීය හා සුභසාධන කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් බොරලැස්ගමුව මහා විද්‍යාලයේ 7,8,9,10 සහ 12 ශ්‍රේණියන්හි අධ්‍යාපනය ලබන සිසුන් 70 දෙනෙකු සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ දැනුවත් කිරීමේ වැඩසටහනක් අදියර 2 ක් යටතේ 2024.10.30 දින පවත්වන ලදී. එම කාර්යාලයේ පුනරුත්ථාපන නිළධාරි මේජර් එස්ඒආර්එන් පෙරේරා ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් මෙහෙයවීමෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරණ අධ්‍යාපන හා තොරතුරු නිළධාරිණී ප්‍රියදර්ශනී රත්නායක මහත්මියගේ සම්පත් දායකත්වයෙන් මෙම දැනුවත් කිරීම සිදු විය.







කළුතර දිස්ත්‍රික් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් මතුගම, සීඩබ්ලිව්ඩබ්ලිව් කන්නන්ගර මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් 527 දෙනෙකු සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.11.07 දින පවත්වන ලදී. කළුතර පුනරුත්ථාපන නිළධාරී කර්නල් පීඒඩීඅයිඑස් සමරනායක ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් මෙහෙයවීමෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කලුතර දිස්ත්‍රික් සහකාර මත්ද්‍රව්‍ය අධ්‍යාපන නිළධාරිනි බී චාමලී ජීවන්ති මහත්මියගේ සම්පත් දායකත්වයෙන් යුතුව මෙම දැනුවත් කිරීම සිදු විය.





පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් දියබෙදුම, ඉරහඳකෙටුවැව මහා විද්‍යාලයේ අධ්‍යාපනය හදාරනු ලබන සිසුන් 290 දෙනෙකු සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2024.11.11 දින පවත්වන ලදී. පොළොන්නරුව කාර්යාලයේ පුනරුත්ථාපන නිලධාරි ලුතිතන් කර්නල් උදිත අංගම්මන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් අරමුණ පැහැදිලි කිරීමෙන් අනතුරුව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර උපදේශන නිලධාරී ඩීඑම් ධනුෂ්ක දිසානායක මහතා ගේ සම්පත් දායකත්වයෙන් මෙම දැනුවත් කිරීම සිදු විය.






# ලෝකයෙන් එදක්..



**ලෝකය කාම ලෝකය, රූප ලෝකය හා අරූප යනුවෙන් ලෝක 03කි.**

### කාම ලෝකය

කාමාවචර කුසල සහ අකුසල වලට අනුව සත්වයා උපත ලබන ලෝක 11 කි.

ඒ අනුව
දිව්‍ය ලෝක 06
මනුෂ්‍ය ලෝක 01
අපාය ලෝක 04 යනුවෙනි.

### රූප ලෝකය

රූපාවචර ධ්‍යාන ලැබූවිට මරණින් පසු ඉපදීමට සුදුසු බඹලොව 16 රූපලෝකය නම්වේ.

### අරූප ලෝකය

අරූපාවචර ධ්‍යාන ලැබූ විට මරණින් පසු ඉපදීමට සුදුසු බඹලොව 04 අරූප ලෝකය නම් වේ.



### ලෝකෝත්තර

ඉහත දැක්වූ කාම, රූප, අරූප ලෝක තුනෙන් එතෙරවීම ලෝකෝත්තර නම් වේ.

### සෝවහන් පුද්ගලයා

සෝතාපත්ති ඵල සිත උපදවාගත් පුද්ගලයාය. ඔහුගේ සසර කෙටිය. කොතෙක් පමා වුවද අටවැනිවරම නොඉපදී තුන්ලෝකයෙන්ම එතෙර වේ.

### සකෘදාගාමී පුද්ගලයා

මරණින් පසු කාම ලෝකයෙහි එක් වරක් ඉපදී තුන් ලෝකයෙන්ම එතෙර වේ.

### අනාගාමී පුද්ගලයා

මරණින් පසුව රූපාවචර බඹලොව උපදී. එහිදීම රහත් ලෝකයෙන්ම එතෙර වේ.

### අරහත් පුද්ගලයා

මරණින් පසු උපදින්නේ නැත. ලෝකයේ එතෙරවූ හෙයින් අරහත් ඵල සිත උපදවා ගත් පුද්ගලයායි.

**අයි.යූ අනුර ගුණවික්‍රම මහතා**
පුනරුත්ථාපන කාර්යාංශය





# ප්‍රජා මෙහෙවර

## සේනපුර ZD ඇළ මාර්ගයේ අතුරු ඇළ ශුද්ධ කිරීම

## නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර



ප්‍රජා මෙහෙවරක් වශයෙන් සේනපුර - නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය වෙත ජලය සපයන සේනපුර ZD ඇළ මාර්ගයේ අතුරු ඇළ ශුද්ධ කිරීමේ ශ්‍රමදානයක් මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනලාභීන් 32 දෙනෙකුගේ ශ්‍රම දායකත්වයෙන් පවත්වන ලදී.

සහකාර පුනරුත්ථාපන අධිකාරී (පුනරුත්ථාපන) ලුතිතන් කර්නල් එස්ආර් කොඩිතුවක්කු සහ සහකාර පුනරුත්ථාපන අධිකාරී (පාලන) ඇතුළු කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් 2024.10.24 දින සිදු කරන ලදී.

# දරුවන්ට දැනෙන්න ආදරේ කරන්න



## දූවරු ගෙදර ඉන්නකොට
## ඒ ගොල්ලෝ වැරදි වැඩ කරනවා
## වෙන්න පුළුවන්.

වෙලාවට නැගිටින්නේ නැති වෙන්නත් පුළුවන්.

පාඩම් කරන්නෙ නැති වෙන්නත් පුළුවන්.

කියනදේ අහන්නේ නැති වෙන්නත් පුළුවන්...
ඒත් දුවලට ගහන්න එපා...
බනින්න එපා...
කරදර කරන්න එපා...
පුළුවන් තරම් එයාලට ආදරේ කරන්න.

**මොකද ගොඩාක් අයට විවාහ වුනාට පස්සේ ඒ නිදහස ලැබෙන්නේ නෑ...**

**ගොඩාක් වෙලාට ඒ අය උදේ පාන්දර නැගිටිනවා. කෑම උයනවා, ඇඳුම් මදිනවා, ගෙවල් මිදුල් අස්කරනවා.**

**දරුවන්ගේ වැඩ කරනවා**
**රෑ නිදාගන්නකම්ම ආයේ මේ නිදහස ලැබෙන්නේ නෑ**

**ඒ නිසා දියණියන්ට පුළුවන් තරම් සලකන්න දරුවන්ට දැනෙන්න ආදරේ කරන්න ඕනේ...**



**සම්පූර්ණ වැඩසටහන අපගේ YouTube නාලිකාවෙන් නැරඹීම සඳහා QR කේතය ස්කෑන් කරන්න.**

ප්‍රියංග කරුණාතිලක
මාධ්‍ය අංශය



: bcgr.media@gmail.com : www.bor.gov.lk






# මතින් නිදහස් වන තරුණ ජීවිත

මතට ලොල්වූ මිනිසා පළමුකොට අහිමි කර ගන්නේ තමන්ගේ පියවි සිහියයි. ඉන් අනතුරුව වැරදි කිරීමට ඇති ලැජ්ජාව, බිය සහ මනුෂ්‍යත්වය ඔහු වෙතින් පළායයි. එයින් තමා මෙන්ම තමන්ගේ සමීපතමයින් ද පීඩාවට පත් කරමින් මුළුමහත් සමාජයටම හානිකර ලෙසින් හැසිරේ. මත් ද්‍රව්‍ය භාවිතය නිරන්තරයෙන් සමාජ හා සෞඛ්‍යමය ගැටළු ඇති කරවන අතර කාලීනව වාර්තා වන සුළු හා මහා පරිමාණ අපරාධ සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීමේදී පැහැදිළි වන්නේ මත්ද්‍රව්‍යය භාවිතය හා අපරාධ අතර අන්තර් සම්බන්ධතාවයක් හඳුනාගත හැකි බවය.

ශ්‍රී ලංකාව තුළ මත් ද්‍රව්‍යයට ඇබ්බැහිවුවන් පුනරුත්ථාපනය කර යහපත් සමාජ පුරවැසියන් බවට පත් කරන පූර්ණ රාජ්‍ය ආයතනය වන්නේ **අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යංශය** යටතේ ස්ථාපිත කර ඇති පුනරුත්ථාපන කාර්යාංශයයි. මේ වනවිට **මතට ඇබ්බැහිවුන් 8822** කට අධික පිරිසක් යහපත් සමාජ පුරවැසියන් ලෙස සමාජයට දායාද කර හමාරය.

මත් ද්‍රව්‍ය ගැටළුවට විසඳුම් සොයමින් යන පුනරුත්ථාපන කාර්යාංශයේ ඒකායන අරමුණ වී ඇත්තේ දරිද්‍රතාවය අවම කරමින්, සමාජයේ අපරාධ වැලැක්වීම සහ පුද්ගල සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම වැනි තිරසර සංවර්ධන ඉලක්ක වලට සහ රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව යමින් රටේ විවිධ තරාතිරමේ පාර්ශව කරුවන් ඒකාබද්ධව ගෙන යන මේ මත් ද්‍රව්‍ය නිවාරණ සහ පුනරුත්ථාපන වැඩසටහනෙහි ඵලදායිතාවය වැඩි කර ගැනීම සඳහා අවශ්‍ය පදනම සකස් කර ගැනීමයි.

නව යෞවනයින් මත් ද්‍රව්‍යයට ගොදුරුවීමට ඇති ඉඩ ඇහිරීමේ ප්‍රබල වැඩසටහනක් ආරම්භ කිරීමට සුදුසුම ස්ථානය පාසල බව හඳුනාගත් අප ආයතනය මේ වන විට දිවයිනේ සියළුම පාසැල් ආවරණය වන පරිදි පාසැල් ළමුන් සහ දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වා ඇති අතර ඉදිරියටද එම වැඩසටහන් පැවැත්වීමට කටයුතු සැළසුම් කර ඇත.

**මතින් නිදහස් වීමට කැමති පුද්ගලයෙකු සිටී නම් ඒ සඳහා උපකාරී කර ගත හැකි ක්‍රියාමාර්ග බොහොමයක් තිබේ.**

**මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවූ ජීවිත ඉන් නිදහස් වීමට ඔබ පළමු ස්ථානය ලබා දිය යුත්තේ ඔබගේ සමීපතමයින්ටය.**

පියංග කරුණාතිලක
මාධ්‍ය අංශය


: bcgr.media@gmail.com : www.bor.gov.lk



# "නත්තල" ගැලවුමේ මංගල්‍යයයි.

**දවසක් එක්තරා ගොවියෙක් තමන්ගේ කුඹුර අද්දර වතුර වලක ගෝනුස්සෙක් වැටී ඉන්නවා දැක්කා. වතුර වලෙන් ගොඩට ඇවිල්ලා තමන්ගේ ජීවිතය බේරගන්න ගෝනුස්සා ලොකු සටනක. මේක දැකපු ගොවියා ගෝනුස්සාව ගොඩට ගැනීමේ අරමුණින් ගහක කොලයකුත් කඩාගෙන ඒ වලට තමන්ගේ අත දැම්මා. ඌත් අර කොලේ එල්ලුනා. ගොවියා පරිස්සමෙන් ඌව ගොඩට ගන්නවත් එක්කම අර ගෝනුස්සා ගොවියාගේ අතට දෂ්ට කළා. ගොවියා ඉක්මණින්ම ගියේ ගමේ වෙද මහත්මයා ලඟට. වෙද මහත්මයා ගොවියාගෙන් මෙහෙම ප්‍රශ්න කළා.**

"ඔබ දන්නේ නැද්ද ඕනෑම පුද්ගලයෙකුව දෂ්ට කිරීම ගෝනුස්සාගේ ස්වභාවය බව?" ගොවියා මෙන්න මෙහෙම පිළිතුරු දුන්නාලු: ගෝනුස්සාගේ ස්වභාවය ඕනෑම කෙනෙක්ව දෂ්ට කිරීම තමයි. හැබැයි මගේ ස්වභාවය ඕනෑම කෙනෙක්ව ගැලවීම යි".

ඔව්, කිතුනු දහමේ ඇදහිල්ල අනුව, ප්‍රේමය වූ දෙවියන් වහන්සේගේ ස්වරූපය වන්නේ පීඩිතයාව ඒ පීඩනයෙන් ගැලවීමයි; පව්කාරයාව පාප උගුලෙන් නිදහස් කිරීමයි. ඒ ගැලවුම්කාර දෙවියන් වහන්සේ මිනිස් ස්වරූපයක් ගෙන අප අතර ඉපැදීම සිහිපත් කරන ඒ අසිරිමත් මංගල්‍යය, නත්තල යි. නත්තල ලොකුවට සමරන්න අවශ්‍ය දෙයක්ද? මේ ලෝකයෙන් සමුගෙන අවසන් කෙනෙක්ගේ උපත අපි උත්සවශ්‍රීයෙන් සමරන්නේ නැහැනේ.

ඉතිං මේ ලෝකයෙන් නික්මුණු ජේසුස් වහන්සේගේ පවා උපත සමරන්න අවශ්‍ය නැහැ කියලා කෙනෙකුට හිතෙන්නට පුළුවන්. හැබැයි, අමතක කරන්න එපා, කිතුනුවන්ට අනුව ජේසුස් වහන්සේ මෙලොව ජීවත් වෙලා අවුරුදු 2000කට පසුව වුනත් නත්තල සැමරීමට අවම වශයෙන් ප්‍රධාන හේතු දෙකක් තිබෙනවා:

1. මරණින් උත්ථාන වුනු ජේසු, අදටත් ජීවමානව අප අතර ජීවත් වන බව
2. ජීවමාන ජේසු අදටත් පීඩිතයාව ගලවන බව, පව්කරුවාව පාප උගුලෙන් ගලවන බවට වන ක්‍රිස්තියානි ඇදහිල්ල නිසා, ඒ ගැලවුම්කරුවාණන්ගේ උපත අදටත් ප්‍රීතියෙන් සැමරිය හැකියි.

ඒ නිසා, ජේසුගේ උපත සිහිකරන අපි, එයින් සිහිගැන්වෙන ඒ ගැලවීමේ පණිවිඩය හෙවත් සුභ ආරංචියත් සිහිපත් කළ යුතුමයි. එලෙස නොවුනොත්, මේ සැමරීමෙන් කිසි ඵලයක් නැති වේවි. නත්තල විසින් සිහි කැඳවන ඒ සුභාරංචිය කුමක්ද? ඒ තමයි, සෑම පුද්ගලයෙකුටම ගැලවීම උරුම බව. ඔබ සිටින්නේ යම් ප්‍රශ්නයක පැටලීද? ඔබට ගැලවීම උරුමයි. ඔබ සිටින්නේ යම් ඇබ්බැහිවීමකද? ඔබට ගැලවීම උරුමයි. ඔබ සිටින්නේ පවුල් අරගලයකද? ඔබට ගැලවීම උරුමයි. මෙන්න මේ සුභාරංචිය අයිති කර ගැනීම තමයි, නත්තලේ අධ්‍යාත්මික හරය.

ශුද්ධවූ බයිබලයේ ලූක් තුමන් විසින් රචිත සුවිශේෂ ග්‍රන්ථයේ එන කිතු උපතේ අන්දරය තුළින් ඉහත කාරණය ඉතා හොඳින් පැහැදිලි වෙනවා. ලූක් තුමන්ට අනුව ජේසු බිළිඳුන්ගේ උපත ගැන මුලින්ම දැනගන්න ලැබෙන්නේ එදා රාත්‍රියේ බැටළුවන් රැනක් බලාගනිමින් හිටිය එඬේරුන් කිහිප දෙනෙකුටයි. එදා පලස්තීනයේ, ජුදා දහම අදහපු ඒ සමාජයේ එඬේරු කියන්නේ කවුද? ඔවුන් පීඩනයට සහ අසාධාරණයට ලක්වූ ජන කොට්ඨාශයක්. ඔවුන් ස්වභාවයෙන්ම වැටුනේ සමාජයේ ඉතාම පහල ස්ථරයකට. සත්තුත් එක්ක දවසේ වැඩිහරියක් ගතකරන ඔවුන්ව ආගමික නායකයෝ පවා සැලකුවේ "අපිරිසිදු" කණ්ඩායමක් හැටියට.


: bcgr.media@gmail.com : www.bor.gov.lk

ඒ නිසා බහුතරයක් ඔවුන් ගැන කතා කළේ "දෙකේ කොලේට දාලා" කියුවොත් නිවැරදියි. එවන් පසුබිමක් තුළ තමයි ස්වර්ගයෙන් වැඩි දේව දූතයෝ ගැලවුම්කරුවාණන්ගේ උපත පිලිබඳ මේ උතුම් පුවත එඬේරුන්ට මෙලෙස දන්වන්නේ: "ස්වාමීන් වන ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් ඔබ හට දාවිත්ගේ නුවර අද උපන්නේ ය. රෙදිවලින් ඔතා ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ඔබට සම්බ වන්නේ ය. එය ඔබට සලකුණ ය."

ඒ කියන්නේ, මිනිස් ඉතිහාසයේ නොමැකෙන සලකුණක් තබන්නට යන ජේසු සමිඳාණන්ගේ උත්පත්තිය මුලින්ම දැනගන්නට ලැබෙන්නේ රජවරුන්ට නොවෙයි, ඉහළ පැලැන්තියේ පවුල් වලටත් නොවෙයි, ආගමික නායකයන්ටත් නොවෙයි. කවුරුත් ගණන් ගත්තේ නැති, කොන් වෙච්ච දුප්පත් පිරිසකට. දරු උපතකින් පසු ඒ දෙමාපියන් එම ආරංචිය මුලින්ම දන්වන්නේ කාටද? පවුලේ ලඟම ඥාතියාට හෝ තමන්ට හිතවත්ම කෙනාට නේද?

එසේ නම්, ගැලවුම්කාරයෙක් ඉපදී ඇති බව මුලින්ම දන්වනු ලබන්නේ පීඩිත පන්තියේ ගොපල්ලන්ට වීම කොයිතරම් අර්ථාන්විතද යන්න ඔබට වැටහෙනු ඇති. ඔව්, දෙවියන් වහන්සේ පීඩිතයාගේ නිදහස වෙනුවෙන්, පවුකරුවාගේ ගැලවුම වෙනුවෙන් මිනිස් වෙසින් මෙලොව උපත ලැබූ සේක. ඉතින්, මේ නත්තලේදී ඒ ගැලවීමේ සුබ ආරංචිය අප සවන් වලට ඇසෙන්නට සලස්වා ගත යුතුමයි. එසේ වුවොත්, ඔබටත් මටත් "හැමදාම නත්තල්!"

**ශානිල් ජයවර්ධන (නි.ම.නි.) පියතුමා**
"මැසනඩ් යොවුන් පියස"
මග්ගොන
**සම්බන්ධීකරණය කේඑස් පෝල්**
**මාධ්‍ය අංශය**

# පුනරුත්ථාපනයට ඔබ්බෙන් යන සංකල්පය යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන්

## ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන හා ඒවායේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - සාරංගා මධ්‍යස්ථානය වව්නියාව




## පුනරුත්ථාපනලාභීන් සඳහා ආතති කළමණාකරණ වැඩසටහන නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු





: bcgr.media@gmail.com : www.bor.gov.lk

# ලෝකෙවම රජෙක් උනත් වැඩක් නෑ

## වදපු දෙමව්පියන් හරියට බලා ගන්න බැරිනම්



**බඩට ආව දවසේ ඉදන් අම්මට නින්දක් නෑ වගේම තාත්තට නිවනක් නෑ....**

තමන් දාඩිය මහන්සියෙන් හම්බකරන හැම සතේම හෙලන හැම දාඩිය බිංදුවක් ම දරුවන්ගේ ජීවිත සැපවත් කරන්න මහන්සි වෙන, දරුවන්ට පුලුවන් හොදම ඇදුම් ආයිත්තම් දී දැලි කඩ මලු ඇඳගෙන හරියට බඩට වෙලක් නොකා දරුවන්ගේම අනාගතය වෙනුවෙන් අනේක දුක් විදින දෙමව්පියන් දෙන්නා හම රැලි වැටිල ඇවිදගන්න බැරුව වයසට ගියාම , එක් තැන් උනාම......

**හරියට තමන්ගේ දෙමව්පියන් බලාගන්න බැරි නම්. උන් ලැබූ මිනිසත් කමෙන් පලක් නැත.**

චුට්ටි කාලේ ඉපදුන දවස් වල මල මුත්‍ර හැමදේම ඇගේ දාද්දි..අතේ පයේ ගැවෙද්දි ..අනිත් අතට ඇග සෝදලා සුවද වෙන්න පවුඩර් දාලා ...අනේ ඔයා මගේ මැනික නේ..අපේ මැනිකනේ කියල ඇගේ ගහාගෙන හදපු දෙමව්පියන් වයසට ගියාම ඇවිදගන්න බැරි උනාම එක තැන මල මුත්‍ර පිටවෙද්දි...ඒ දිහා ආදරයෙන් කරුනාවෙන් බලල ,මේ අද මෙහෙම වයසට ගිහින් ඉන්නෙ..මම වෙනුවෙන් මේ ලෝකේ වැඩිම ආදරේ දුන්න, මාව රැකපු, මාව ලොකු මහත් කරපු කැපකිරීම් කරපු කෙනා නේද කියල.. කියල ආදරෙන් ඇප උපස්ථාන කරන්න බැරිනම් උන් තරම් ගුනමකු අසත් පුරුෂයෝ තවත් මේ ලෝකයේ නැත...

ලෙඩක් දුකක් හැදුනම ,ආ බයවෙන්න එපා මගේ රත්තරන් මැනික තාත්තා ලග ඉන්නවා..අපි බෙහෙත් ගේන්න යමු ඔයාට මොකුත් වෙන් නෑ කියල දරුවෙක් ලෙඩ උනාම දුන්න ඒ විශ්වාසය ශක්තිය පෙරලා දෙමව්පියන්ට දෙන්න බැරි නම් එයාල ලෙඩ උනාම වසයට ගියාම වාරු නැති උනාම දැන් ජීවත් වෙනවට වඩා මැරිලා ගියා නම් කියන තැනට ඒ දෙමව්පියයෝ අසරණ වෙනවානම් ඒ දරුවන්ගේ ලැබූ මිනිසත් කමෙන් පලක් නැත.

**ජීවිතය චක්‍රයක් වගේ**
**කැරකෙන මේ සංසාරයේ**
**දරුවන් විදියට කරන්න**
**ඕන යුතුකම් හරියට ඉටු**
**නොකරන කෙනෙක්ට**
**මැරෙන මොහොත**
**වෙනකම් ඒ ගැන**
**පසුතැවිලි වෙන්නට**
**විදවන්න හේතු වෙනවාම**
**තමයි. මොකද**
**තාත්තෙක් අම්මෙක්**
**ජීවිතේ හම්බවෙන්නෙ**
**එකම එක වතාවයි ඒ**
**වගේම ආදරේ නැවත**
**කිසිම දාක ලැබෙන්නෙ**
**නැති නිසා...**




ප්‍රියංග කරුණාතිලක
මාධ්‍ය අංශය





: bcgr.media@gmail.com : www.bor.gov.lk

# මතින් තොර රටක්

# නීරෝගී පුරවැසි දිවියක්

වර්තමානය වන විට මත්ද්‍රව්‍ය භාවිතය ශීඝ්‍ර ලෙස ඉහළ යෑම හේතුවෙන් එය සමාජ ව්‍යසනයක් බවට පත්වී ඇත. පවුල තුළ මෙන්ම සමාජය තුළ ද බරපතල ගැටලු රාශියක් නිර්මාණය කිරීමට මත්ද්‍රව්‍ය භාවිතය හේතුවී ඇත. පාසැල් දරුවන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි කර ගැනීමේ ප්‍රවණතාව ඉහළ ගොස් ඇත. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් බන්ධනාගාරගත කිරීමෙන් පමණක් මෙම උවදුර වලක්වා ගැනීමට හැකියාවක් නැත. වර්තමානය වන විට මත්ද්‍රව්‍ය සමාජ ඛේදවාචකයක් නිර්මාණය කිරීමට හේතුවී ඇති අතර 2022 වසරේ පුද්ගලයින් 152,979 ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබ තිබුණි. එහෙත් මේ අතරින් පුනරුත්ථාපන වැඩසටහන් සඳහා යොමු කර තිබුණේ පුද්ගලයින් 1930ක් පමණි. බන්ධනාගාරගත වන වැරදිකරුවන් අතරින් 60%ක් පමණ පුද්ගලයින් බන්ධනාගාරගත වන්නේ මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙනි. මින් පෙර දේශපාලනික හා වෙනත් බලවේග ආරක්ෂාව යටතේ ශ්‍රී ලංකාව කලාපයේ මත්ද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්ව තිබූ අතර එය සංවිධානාත්මක අපරාධ වර්ධනයවීමට බලපා ඇත. එබැවින් වත්මන් රජය මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.





# ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමයෙන් හා සහජීවනයෙන් ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ දේශනය

වව්නියාව, සාරංගා මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනලාභීන් **70** දෙනෙකු සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් අතර සාමයෙන් හා සහජීවනයෙන් ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් සමස්ත ලංකා ඉස්ලාම් ආගමික විද්වත් සභාවේ (සමස්ථ ලංකා ජම්ඉයියතුල් උලමා සංවිධානය) සාමය සහ සහජීවනය පිළිබඳ සම්බන්ධීකාරක, පවුල් උපදේශන නිළධාරි - පීඑල් සල්මාන් මවුලවි තුමා, මත්ද්‍රව්‍ය උපදේශණ නිලධාරි එස්එම් රම්සි ක්‍රාති මහතා ඇතුලු විද්වතුන් පිරිසකගේ සම්පත් දායකත්වයෙන් **2024.11.07** දින පවත්වන ලදී.











සාරංගා මධ්‍යස්ථානය - වව්නියාව



: bcgr.media@gmail.com : www.bor.gov.lk

# NYSCO

## ආයතනයේ ක්ෂේත්‍ර චාරිකාව සහ අභිප්‍රේරණ වැඩසටහන

### නවෝදාව - ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු



ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත NYSCO ආයතනයේ මනෝ විද්‍යාව හා උපදේශන ඩිප්ලෝමා පාඨමාලා හදාරනු ලබන සිසුන් 55 දෙනකුගේ ප්‍රායෝගික පුහුණුව සඳහා එම පිරිස නවෝදාව - ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු වෙත 2024.10.26 දින ක්ෂේත්‍ර චාරිකාවක නිරත වන ලදී.

මනෝ විද්‍යාව සහ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය භාග්‍යා අබේසිංහ මහත්මිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සහ පාඨමාලාවේ සිසුන් විසින් සිය පුහුණුව සඳහා අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වූ අතර, පුනරුත්ථාපනලාභීන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව පුනරුත්ථාපනලාභීන් සදහා අභිප්‍රේරණ වැඩසටහනක් ද පවත්වන ලදී.











: bcgr.media@gmail.com : www.bor.gov.lk

# පුනරුත්ථාපනලාභීන් වෙනුවෙන් පවත්වනු ලබන වෛද්‍ය සායන

## ලිංගාශ්‍රිත රෝග පිළිබඳ දේශනය සහ සායනය
## නවෝදාව - තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර

පුනරුත්ථාපනලාභීන් 35 දෙනෙකු සඳහා ලිංගාශ්‍රිත රෝග පිළිබඳ දේශනය සහ සායනයක් පොළොන්නරුව ලිංගාශ්‍රිත රෝග පාලන ඒකකයේ හෙද නිලධාරිණී ජීඊඑච් පෙරේරා මහත්මිය උපස්ථායිකා බීජී චමිලා කුමාරිගේ සම්පත් දායකත්වයෙන් 2024.11.02 දින පවත්වන ලදී.




## ලය රෝග සායනය සහ දේශනය
## නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය

නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනලාභීන් සඳහා පොළොන්නරුව මහ රෝහලේ වෛද්‍ය ඩබ්ලිව්ඒඑන් ජයවීර මහතා ගේ ප්‍රධානත්වයෙන් ලය රෝග පිළිබඳ සායනයක් සහ දේශනයක් 2024.10.08 දින පවත්වන ලද අතර, මේ සඳහා පුනරුත්ථාපනලාභීන් 34 දෙනෙකු සහභාගී වන ලදි.





: bcgr.media@gmail.com : www.bor.gov.lk



# පුනරුත්ථාපනලාභීන් සහ ඔවුන්ගේ සාමාජිකයින් සමඟ හමුව

නවෝදාව - ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කන්දකාඩු





නවෝදාව - තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර





සාරංගා මධ්‍යස්ථානය - වව්නියාව





පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි නේවාසිකව පුනරුත්ථාපනය වනු ලබන සෑම පුනරුත්ථාපනලාභීයෙකු සඳහාම සෑම මසකටම දෙවතාවක් ඔහු විසින් නම් කළ ළඟම ඥාතීන් හමුවීමේ අවස්ථාවක් උදා කර දී ඇත. ඒ යටතේ හමුවූ අවස්ථාවන් කිහිපයක්.

# personality පෞරුෂත්වය

වර්තමාන මනෝවිද්‍යාවේ ඉතා වැදගත් සංකල්පයක් ලෙස පෞරුෂත්වය පිළිගැනේ. පෞරුෂය ගැන සාමාන්‍ය ව්‍යවහාරයේදී ද විවිධ තේරුම් ගෙන දෙයි. ඒ පිළිබඳ පොදු මතයකට එළඹීමට ඉතා අපහසු වී ඇත. ගෝර්ඩන් ඕල්පොට් විසින් පෞරුෂය ගැන කරුණු දක්වමින් පෙන්වා දී ඇත්තේ ඒ පිළිබඳව නිර්වචන 50ක් පමණ පවතින බවයි. ඇතැම් අය පුද්ගලයකුගේ බාහිරව පෙනෙන චර්යාව අනුව පෞරුෂය විග්‍රහ කරලීමට උත්සාහ ගෙන ඇත. වත්මන් මනෝ විද්‍යාවේ පෞරුෂත්වය යන්න සංකල්පීය නිර්මිතයක් ලෙස සැලකේ. පෞරුෂත්වය විද්‍යමාන නොවන නමුත් කෙනෙකුගේ සිතුම් පැතුම් අතරින් ඔහුගේ චර්යාව දැන ගැනීමෙන් කෙනෙකුගේ චරිතය පූර්ව කථනය කළ හැකිය.

පෞරුෂය ගැන හදාරන්නවුන් විසින් ව්‍යුහය හා ප්‍රවර්ධනය ගැන හදාරා ඇත. පෞරුෂය ගැන වර්තමාන අධ්‍යයන වලදී ප්‍රවර්ධනයට වැදගත් තැනක් ලැබී ඇත. පෞරුෂය ඇති වන්නේ කෙසේද එහි වර්ධනය කෙසේද, විපර්යාසය කවරේද යන්න දැන් ගතික විග්‍රහ ලෙස පිළිගැනේ. ගතික විග්‍රහයකදී පුද්ගලයාගෙ බාහිර ක්‍රියා පමණක් නොවන ඒවාට යටින් ඇති හරය පිළිබඳවද විමසිය යුතු වේ.



පෞරුෂය අනන්‍යසමයයි. පෙර අදහසක් පැවතුනද අද පිළිගැනීම අනුව සාමාන්‍ය සංකල්පයක් ලෙස මුලිකව ඔල්පොට් වැනි අය පවා මෙය අනන්‍ය සම බව පිළිගත්තද පුද්ගලයා තුළ පෞද්ගලික විෂමතා තිබුණද ඊට වඩා පොදු ලක්ෂණ පවතින බව පෙනී යන නිසා පෞරුෂය සාමාන්‍ය බව පිළිගෙන ඇත. පෞරුෂ අධ්‍යයනයේදී ඇති තවත් වැදගත් ප්‍රශ්නයක් වී ඇත්තේ චරිතය සහ ප්‍රකෘතිය පිළිබඳවයි. පොදු ව්‍යවහාරයේදී පෞරුෂය වෙනත් අයුරකින් ප්‍රකාශ කිරීමක් ලෙස හැඳින්වුණි. දැන් එය පෞරුෂයේම කොටස් දෙකක් ලෙස සැලකේ.

මනෝ විද්‍යාඥයන් විසින් පෞරුෂත්වය පිළිබඳව නිර්වචන රැසක් ඉදිරිපත් කර ඇත. මෙම නිර්වචන අතර පොදු පිළිගැනීමක් වනුයේ අන් අය ඔබ කෙරෙහි අවධානය යොමු කරලීමේදී පවත්නා ලක්ෂණ පෞරුෂය ලෙස පිළිගත් බවය. දේශප්‍රිය හොඳ පෞරුෂයක් ඇතැයි යනුවෙන් කී විට ඉන් අවබෝධ වනුයේ මිනිසුන්ට ලෙහෙසියෙන් අමතක නොවන සුළු ගතියක් ඔහු තුළ පවතින බවය. ඔහු උසස් ප්‍රබෝධාත්මක අගයකින් යුක්ත බවයි.

අන් අයුරකින් පුද්ගලයකුගේ පෞරුෂ රටාව හඳුනාගනුයේ ඇය හෝ ඔහු තුළ පවතින චණ්ඩතා ලක්ෂණ අනුව බව පෙනේ. නිමල් දුර්වල පෞරුෂයකින් යුක්ත යයි පවසනුයේ ඔහු තුළ යමක් ඇද ගැනීමේ ශක්තියෙන් හීන බවයි.

විද්‍යාත්මක ලෙස පෞරුෂ සංකල්ප පිළිබඳව කරුණු අනාවරණය කර ඇත. 1919 දී ජේ. කෙම්ප් විසින් පෞරුෂය මෙසේ නිර්වචනය කර ඇත. "සිරිත් පරිදි ඇති කර ගත් සැකසීම එයටම අදාළ ආත්ම කේන්ද්‍රී ප්‍රේරණ සහ පරිසරයේ අවදානම්තා යන අංශ දෙක අතර ඇතිවන ජීව වස්තූන්ගේ බලයන් පෞරුෂත්වයයි.

මෙම නිර්වචනය අනුව පුද්ගලයකු තුළ පවතින අභ්‍යන්තර පෞරුෂ රටාවේ ශක්‍යාත්මක උපයෝගීතාව පිළිබඳව අවධාරණය කර ඇත. මෙය කෙම්ප්ගේ නිර්වචනයට වඩා පුළුල්ව දක්වා ඇත.

1924දී පොලියිඩ් ඔල්පෝට් විසින් මෙසේ නිර්වචනය කර ඇත. '' මිනිසුන් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්කම් සොයා බලන වැදගත් මතයක් ගැන සොයා බැලීමක් පෞරුෂත්ව ලක්ෂණයන්ගෙන් කෙරේ.

" 1928 දී සිමෙන්ඩ්ස් විසින් ඉදිරිපත් කළ නිර්වචනයෙන් කියවුනේ " පෞරුෂත්වය යනු චරිතය පමණක් නොව ඒවායේ ප්‍රතික්‍රියා පමණක් නොව පුද්ගල ජීවිත සැකසීම සහ ජිවිත ඉතිහාසයද ඇතුළත් බවයි." සමාජ ප්‍රබෝධාත්මක අගය පෞරුෂය වේ.

පුද්ගලයාට සුවිශේෂ වූ එම පරිසරය අනුව ඔහුගේ චර්යාව නියත කරන පුද්ගලයා තුළ ඇති මනෝ භෞතික පද්ධතීන්ගෙන් සමන්විත ගතිත සංවිධානය පෞරුෂත්වය වේ.

ඉහත සාකච්ඡා වූ සෑම නිර්වචනයකටම වඩා පුළුල්ව පෞරුෂය පිළිබඳව කරුණු මෙයින් ප්‍රකාශ වුණි.



ලුතිතන් කර්නල් ඒඑම්ඒ දේශප්‍රිය
සහකාර කොමසාරිස් පුනරුත්ථාපන


: bcgr.media@gmail.com : www.bor.gov.lk

# නිසදැස්

## පුනරුත්ථාපනලාභී



K - 10614



Roshan harshana.



K 10870

Sajith Rathnayake



K - 10614

# සිනා සාගරය























## මේතන ඉන්න සුපිරිම මොඩයා කව්ද ?

## කියමු බලන්න






: bcgr.media@gmail.com : www.bor.gov.lk

# “කැළණි සවිය”

## සංගමයේ තවත් සමාජ සත්කාරයක්

**සහතිකපත් ප්‍රදානෝත්සවය - ගෘහස්ථ විදුලි පරිපථ පාඨමාලාව - නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය - සේනපුර**

"කැළණි සවිය" සංගමයේ සමාජ සත්කාරක වැඩසටහනක් වශයෙන් පුනරුත්ථාපන කාර්යාංශය හා එක්ව කාර්යාංශය යටතේ පවත්නා නවෝදාව - ප්‍රතිකාරක මධ්‍යස්ථානය, නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය හා සාරංගා මධ්‍යස්ථානයේ පුනරුත්ථාපනලාභීන් 35 දෙනෙකු සඳහා "කැළණි කේබල්ස් සමාගමේ අනුග්‍රාහකත්වයෙන් මාස 03 ක ගෘහස්ථ විදුලි පාඨමාලාවක් පවත්වන ලද අතර, එම පාඨමාලාව සාර්ථකව නිම කළ පුනරුත්ථාපනලාභීන් සඳහා සහතිකපත් ප්‍රදානය 2024.06.01 දින සිදු කරන ලදී.

මෙම පාඨමාලාව ගෘහස්ථ විදුලි පරිපථ සැකසීම, ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම ආදී කරුණු ඔස්සේ කැළණි කේබල්ස් සමාගමේ අනුග්‍රාහකත්වයෙන් සහ සම්පත් දායකත්වයෙන් පැවැත්විණි.







පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජෙනරල් දර්ශන හෙට්ටිආරච්චි මැතිතුමා සහ "කැළණි සවිය" පාඨමාවේ සම නිර්මාතෘ විදුලි හා විදුලි ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කීර්තිධර පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය ජනක ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම සහතික ප්‍රදානෝත්සවය පැවති අතර,

දිනමිණ සිළුමිණ
epaper

පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින්

**සමාජගත කරන්නේ ජීවිතයේ වෘත්තීය පුහුණුව ලැබූ පිරිසක්**

**ඔවුන් ප්‍රතික්ෂේප නොකර පිළිගැනීම සමාජයේ වගකීමක්**

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජෙනරාල් දර්ශන හෙට්ටිආරච්චි



"කැළණි සවිය" සම නිර්මාතෘ සහ "කැළණි ශක්ති"නිපුණතා සංවර්ධන සමාජ සත්කාරක වැඩසටහනේ සම්බන්ධීකාරක ජයන්ත විජේසිංහ මහතා,

"කැළණි සවිය" ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභාපති පොළොන්නරුව කාර්මික විද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පාඨමාලාවේ පාඨමාලා උපදේශක සහ පාඨමාලා අධ්‍යක්ෂ ජීඩිකේ සමරනායක මහතා, කැළණි කේබල්ස් සමාගමේ සහකාර මානව සම්පත් කළමණාකාර තුෂාර මදුශංක පෙරේරා මහතා ඇතුළු එම සමාගමේ නිළධාරීන් සහ උපදේශකවරුන් කොමසාරිස් (පුනරුත්ථාපන) බ්‍රිගේඩියර් රජිත් වෛද්‍යසේකර, පුනරුත්ථාපන අධිකාරී සාරංගා මධ්‍යස්ථානය බ්‍රිගේඩියර් දුලිත් පෙරේරා, පුනරුත්ථාපන අධිකාරී නවෝදාව ප්‍රතිකාරක මධ්‍යස්ථානය - කර්නල් ගාමිණී සිල්වා, පුනරුත්ථාපන අධිකාරී නවෝදාව තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය කර්නල් සනත් අබේතිලක ඇතුළු පුනරුත්ථාපන කාර්යාංශයේ නිළධාරීන් සහ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මෙම සහතික ප්‍රදානෝත්සවය සිදු කරන ලදී.




මාධ්‍ය අංශය